# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව

# ඇබෑර්තු

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : **1. කළමනාකරු (තනතුරු 01 යි)**

**2. විගණන නිලධාරී (තනතුරු 01 යි)**

**සුදුසුකම්** : **කළමනාකරු (වැවිලි)**

(අ) බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / ව්‍යාපාර අධ්‍යයනය / ව්‍යාපාර කළමනාකරණය / වැවිලි කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍ය පිළිබඳ ප්‍රථම උපාධියක්

සහ

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ප්‍රාදේශීය වැවිලි සමාගමක, ශ්‍රී ලංරාව සංස්ථාවේ හෝ ජනවසම වත්තක කළමනාකරු (වතු) / අධිකාරී තනතුරක එක් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සහකාර අධිකාරී / සහකාර කළමනාකරු – වැවිලි තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය** : කළමනාකරණ සේවා 02/2016 චක්‍රලේඛය ප්‍රකාරව MM1-1-2016 රු. (53,175–10X1,375–15X1,910–95,575) වැටුප් පරිමාණයක් ඉහත තනතුරට හිමිවේ.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**අමතර වරප්‍රසාද** : ගෘහස්ථ අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සේවක අර්ථ සාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියට ඔබේ වැටුපෙන් අවම වශයෙන් සියයට දහයක (10%) දායකත්වය සහ එවන් අර්ථ සාධක අරමුදලකට ශ්‍රී ලංරා.වැ. සංස්ථාවේ දායකත්වය උපරිම 12% ක් සහ සේවක භාරකාර අරමුදලට වැටුපෙන් 3% ක දායකත්වය.

නිල වාහනයක් හා ඉන්ධන දීමනාවක් ලබා දෙනු ඇත. ගෘහභාණ්ඩ සහිත බංගලාවක් සහ අභ්‍යන්තර සේවකයින් 2 කු හා බාහිර සේවකයින් 2 කු සඳහා කම්කරු දීමනාවන් ලබාදෙනු ලැබේ.

**විගණන නිලධාරී**

**(අ) බාහිර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත්, ගිණුම්කරණය / මූල්‍ය කළමනාකරණය / කළමනාකරණය / වාණිජ්‍යය පිළිබඳ ප්‍රථම උපාධියක්.
2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක තනතුරට අදාළ විෂය පථයක අන්තර්මධ්‍ය විභාගයකින් සමත්වීම.

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර – තාක්ෂණික නොවන (MA 1-1) II වන ශ්‍රේණිය තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**අමතර වරප්‍රසාද** : අභ්‍යන්තර හා බාහිර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය.

සේවක අර්ථසාධක අරමුදලට හෝ ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සමිතියට ඔබේ වැටුපෙන් අවම වශයෙන් සියයට දහයක (10%) දායකත්වය සහ එවන් අර්ථ සාධක අරමුදලකට ශ්‍රී ලං.රා.වැ. සංස්ථාවේ දායකත්වය උපරිම 12% ක් සහ සේවක භාරකාර අරමුදලට වැටුපෙන් 3% ක දායකත්වය.

**පොදු** : ඔබට නිල වාහනයක් ලබා දෙන අතර, ශ්‍රී ලංරා.වැ. සංස්ථාවේ වතුයායන්හි විගණන කටයුතු සඳහා ගමන් කිරීමට යැපීම් දීමනා ගෙවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : කළමනාකරණ සේවා 02/2016 චක්‍රලේඛය

ප්‍රකාරව, JM 1-1-2016 රු. (42,600–10X755–18X1,135–70,580) වැටුප් පරිමාණයක් ඉහත තනතුරට හිමිවේ.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය (ඉහත තනතුරු දෙක සඳහා)**

: පත්කිරීමේ අධිකාරිය විසින් පත්කරන ලද මණ්ඩලයක් මගින් මෙහෙයවන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.**

| | |
|---|---|
| ● අදාළ අමතර පළපුරුද්ද | – ලකුණු 30 |
| ● අදාළ අමතර සුදුසුකම් | – ලකුණු 30 |
| ● වෙනත් ජයග්‍රහණයන් | – ලකුණු 15 |
| ● සම්මුඛ පරීක්ෂණයේදී කාර්යසාධනය | – ලකුණු 25 |
| | ලකුණු 100 |

**වෙනත් (ඉහත තනතුරු දෙක සඳහා)** - මෙම ප්‍රභේදය සඳහා සියලුම බඳවාගැනීම් මෙම බඳවා ගැනීමේ යෝජනාක්‍රමයේ විදිවිධානවලට විධිවත්ව යටත් වනු ඇත.

තනතුරෙහි රාජකාරි මැනැවින් ඉටුකරලීමටත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් කායික හා මානසික වශයෙන් යෝග්‍යවිය යුතුය. මනා චරිතයකින් හෙබි අයකු විය යුතුය.

**අයදුම්පත්** : අයදුම්කරුවන් තම සියලු විස්තර සහිත අයදුම්පත්, උප්පැන්න සහතිකයේ, අධ්‍යාපන හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කොට පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන්නට සැලැස්විය යුතුය. ලංසු භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් ඔවුන්ගේ නිර්දේශය සමග ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් භාරගන්නා**

**අවසාන දිනය** : 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,**
**නො. 21, බීසීසී පරිශ්‍රය,**
**මීරානියා වීදිය, කොළඹ 12.**

**2022-12-13**